ඝාතන-දිවි තොර කරගැනීම් එතරම් සුලභ සිදුවීම් නොවේ. නමුත්, එවැනි සිදුවීම් වලට ඉහළ මාධ්‍ය අවධානයක් ද ලැබේ. එවැනි සිදුවීම් වාර්තා කිරීමේදීද දිවි තොර කරගැනීම් වාර්තාකරණය සඳහා වන මාර්ගෝපදේශ අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වන්නේ ඒ නිසායි.

ඊට උදාහරණයක් ලෙස, මාර්තු 12, 2022 දින ගලේවෙලදී පුද්ගලයෙකු සිය දරුවන් ඝාතනයට තැත් කොට දිවි තොර කරගැනීමේ පුවතක් මාධ්‍ය තුළ ආවරණය වී තිබූ ආකාරය ගත හැක. ඒ පිළිබඳ අපගේ නිරීක්ෂණයන් මෙසේයි.

1) ඇතැම් මාධ්‍ය ප්‍රමුඛතාවයකින් යුතුව මුල් පිටුවේ මෙම පුවත පළ කොට ඇත: මෙවැනි පුවතකට නුවුවමනා ප්‍රමුඛතාවයක් ලැබීම ඔස්සේ ද, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇත්තවුන්ට අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් සැපයිය හැක.

2) ඇතැම් මාධ්‍ය දිවි තොර කරගත් ආකාරය සඳහන් කර ඇත: දිවි තොර කරගැනීමේ නැඹුරුතාවය ඇති අයවලුන් එම ආකාරය අනුගමනය කරමින් අනුකාරක දිවි තොර කරගැනීම් සිදු කිරීමේ හැකියාවක් පවතී.

3) සියළුම මාධ්‍ය උපකාරක අංක පළ කර නැත: මෙවැනි පුවත් හා හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට ඉඩක් ලැබිය හැක.

4) හිරු පත්තරේ විස්තරේ සහ දෙරණ අරුණ වැඩසටහන් තුළ, දිවි තොර කරගත් අය පිළිබඳව චෝදනා මුඛයෙන් සඳහන් කෙරේ: ඝාතන-දිවි තොර කරගැනීම් පසුපස ඇති කරුණු අතිශයින්ම සංකීර්ණ බව සැලකිල්ලට ගත් විට, දිවි තොර කරගත් අය වෙත දොස් පැවරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් සහිත තවත් අයෙකු උපකාර පතා ඉදිරිපත් නොවීමේ අවදානමක් තිබේ.

මේ පිළිබඳව එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ පළවී නොතිබුණි.

එසේ නම්, ඔබ සිතනා ලෙසට, දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ ජාත්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙම පුවත ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොතිබුණිද? ඔබේ අදහස කුමක්ද?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://media.samaritans.org/.../Samaritans_Ireland_media...
https://www.simplerecovery.com/the-dangerous-effects-of.../